# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1894/4 - 2014 දෙසැම්බර් මස 22 වැනි සඳුදා - 2014.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/83.

**1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත**

11 වන වගන්තිය යටතේ වූ නියමය

1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනතේ 11 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්, ගමගේ අනුර වික්‍රමසිරි විජේසේකර වන මා විසින් මහජනයාගේ හිත පිණිස සහ පළිබෝධ නාශක තාක්ෂණික හා උපදේශක කමිටුවේ උපදේශය මත මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති සාරමය සැපයුම් ලියාපදිංචි අංක දරන සක්‍රීය රස ද්‍රව්‍ය අන්තර්ගත වන පළිබෝධ නාශක සම්බන්ධයෙන් නිකුත් කර ඇති සෑම බලපත්‍රයක්ම II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශවල භාවිතය, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම තහනම් කරමින් මේ නියමය මගින් වෙනස් කරනු ලැබේ.

ආචාර්ය ජී. ඒ. ඩබ්. විජේසේකර,
පළිබෝධක නාශක රෙජිස්ට්‍රාර්.

2014 දෙසැම්බර් මස 22 වැනි දින,
පේරාදෙණියේ දී ය.

**උපලේඛනය**

| I වන තීරය | | II වන තීරය |
|---|---|---|
| *සාරමය සැපයුම් ලියාපදිංචි අංකය* | *සක්‍රීය රස ද්‍රව්‍ය* | *භාවිතය, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම තහනම් ප්‍රදේශ* |
| 1071-83-6 | ග්ලයිෆොසෙට් | අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, මොණරාගල දිස්ත්‍රික්ක තුළ හා බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය, රිදීමාලියද්ද සහ කන්දකැටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ |
| 709-98-8 | ප්‍රොපනිල් | |
| 63-25-2 | කාබරිල් | |
| 2921-88-2 | ක්ලෝෆයිරිපොස් | |
| 1563-66-2 | කාබොෆියුරාන් | |

01 - 225

1A - PG 2299 — 255 (2014/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*